# ඉවතලන පොළොස් කටුවලින් දේශීය කෘමිනාශකයක් හා පොහොර දියරයක්....

**ව**ස විසවලින් තොර පෝෂණීය ආහාර වේලක් පැරණි හෙළ ගොවිතැන අනුව වගා කරමු යන මාතෘකා ඔස්සේ මාධ්‍ය ප්‍රචාරණ සිදුවන වකවානුවක මෙන් ම, රජය මගින් දියත් කර ඇති **"දිවි නැගුම"** ගෙවතු වගා දශ ලක්ෂයේ වැඩසටහන යටතේ කාබනික පොහොර භාවිතයෙන් ගෙවතු සැකසීමේ දීප ව්‍යාප්ත ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති වර්තමානයේ කිසිදු වියදමකින් තොරව දේශීය කෘමි නාශකයක් හා දියර පොහොරක් සොයා ගත් ගොවි මහත්මයෙකු සම්බන්ධයෙන් සටහනක් තැබීමට ලැබීම මම ලද භාගයක් කොට සලකමි.

මෙම ගොවි මහතා බස්නාහිර පළාතේ අංක 252 "ශාන්ති", කහතුඩුව, පොල්ගස්ඕවිට පදිංචි ඒ.ඒ.ඩී. ජගත් කුමාර මහතා ය. හෙතෙම කුඩා ව්‍යාපාරයක් ලෙස දේශීය ආහාර වන කොස්, පොළොස්, අල වර්ග හා පළා වර්ග ඇගලුම් කර්මාන්ත ශාලාවලට හා ආපනශාලා සඳහා දිනපතා සැපයීම් කරන්නෙකි. මෙම ව්‍යාපාරය කරන්නේ තමාගේම - ශ්‍රමයෙන් වන අතර තම ගෙවත්තේ ඇති කොස් ගස්වලින් ද විශාල ආදායමක් ලබා ගනී. ඔහු කොස් ගෙඩිවලින් ඉවත් කරන කොස් කටු පොතු මුලින් ම ගස් මුල්වලට දමා ඇත. අනතුරුව, එම කොස් කටු දිරාපත්වීමත් සමග පොහොරක් බවට පත්වන බැව් ඔහුගේ නිරීක්ෂණට ලක් විය. පසුව, එම පොළොස් කටු සිමෙන්ති පොළොවක් මත දමන ලදී, සති දෙකක් පමණ ගිය පසු මෙම පොළොස් කටුවල විශාල වශයෙන් පණුවන් බෝ වී ඇති බව ජගත් මහතාට දැකගන්නට ලැබුණි. තව ද, දුඹුරු පැහැති දියරයක් එයින් වෑස්සෙන බැව් ද නිරීක්ෂණය විය. එම දියරය පුනීලයක් මගින් ප්ලාස්ටික් කෑන්වලට එකතු කර තම ගෙවත්තේ දී ම සුළු සුළු පරීක්ෂණයන් සිදු කරන ලදී, පණු දියර පොහොර සම්බන්ධයෙන් ද ජගත් මහතාට මෙයට ප්‍රථම අවබෝධයක් තිබුණි. ඒ අනුව ඔහු විසින් තම ගෙවත්තේ වගාකරන ලද වම්බටුවලට වැළඳුණ රෝගයන් සඳහා කෘමි නාශකයක් වශයෙන් මෙම ද්‍රව්‍යයන් යොදා ගන්නා ලද අතර එය සාර්ථක විය. තව ද, තම ගෙවත්තේ වගා කරන ලද මිරිස්, දෙල් වැනි බෝගයන්ට වැළඳුණ රෝගයන් සඳහා ද එම දියරයම ජලය මිශ්‍ර කර යොදන ලදී, එය ද සාර්ථක විය. තව ද, ඔහුගේ නිරීක්ෂණයට අනුව මෙම දියරය මදුරුවන් බෝවන මාධ්‍යයක් නො වන බව ද පෙනිණි. මෙම දියරයට වතුර කලවම්කර ස්ප්‍රේ කිරීමෙන් රෝග මර්දනය කළ හැකි බව පැවසෙන අතර මෙම දියරය පොහොර දියරයක් වශයෙන් ගස්වලට දැමිය හැකි බව ද පවසයි. පොළොස් කටුවලින් ඉතිරිවන රොඩු කාබනික පොහොරයි. මොහු එම පොහොර තම ගෙවත්තේ බෝග සඳහා යොදන බවත්, ඒ මගින් වැඩි අස්වැන්නක් ලැබෙන බව ද පවසයි. තව ද, ජගත් මහතා කාබනික පොහොර නිෂ්පාදකයෙක් ලෙසට ලියාපදිංචි වුවෙකි.

කහතුඩුව ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරිණී පර්ලි රංජනී මහත්මිය වෙත මෙම සොයා ගැනීම ජගත් මහතා විසින් දන්වන ලද අතර ඇය මෙම සිදුවීම බෝඹුවල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය වෙත යොමු කොට තිබේ. එම ආයතනයෙන් සාර්ථක පිළිතුරක් මෙතෙක් ලබා දී නොමැත. ඒ අනුව, ජගත් මහතා විසින් මෙම සොයා ගැනීම පිළිබඳ නිෂ්පාදන වෙළෙඳපොළට යැවීමට තිබූ අදහස අත හැර දමා ඇත. යම් ආයතනයක් හෝ රජය මගින් තමා වෙත පහසුකම් හා ආධාර ලබා දෙන්නේ නම් මෙම ව්‍යාපෘතිය ඉතා පුළුල් ලෙස කිරීමට හැකියාව ඇති බව ජගත් මහතා පවසයි.

ජගත් මහතා දේශීය ඇඹුන් කෙසෙල් පැළ වගාවක් ද ආරම්භ කොට ඇත. එම පැළ පොලිතින් උරවල සිටුවා ඇති අතර ඒ සඳහා යොදන්නේ තම ගෙවත්තේ නිපදවන පොළොස්කටු කාබනික පොහොර ය. ඒ අනුව, තමාට විශාල වශයෙන් කෙසෙල් පැළ නිෂ්පාදනය කිරීමට හැකි බව ද ඔහු පවසයි. මෙම කෙසෙල් වර්ගය මාස 8 පීදෙන කෙසෙල් වර්ගයකි. **"දිවි නැගුම"** වැඩසටහන යටතේ මෙම කෙසෙල් පැළ ගෙවතු සඳහා ලබාදීමට තමා අදහස් කරන බැව් ද, ඒ මහතා පවසයි. තම ඉඩමේ අක්කර 3/4 ක ප්‍රමාණයක තේ වගා කර ඇති අතර තේ වගාවට ද මෙම දියරය පොහොරක් වශයෙන් යොදා ඇත. මෙම කෘමිනාශකය හා පොහොර දියරයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් පර්යේෂණයට යොමු කර නොමැති බවත්, එය ළඟදීම සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් ඔහු පවසයි.

කිසිදු වියදමකින් තොරව තම ගෙවත්තේ ම නිෂ්පාදනය කළ හැකි මෙවන් දේශීය කෘමි නාශකයක් හා පොහොර දියරක් සොයා ගත් ජගත් මහතා වැනි අය ඇගයීමට

ලක්විය යුතු ය. තව ද, ඔහු සාම්ප්‍රදායික ගොවි මහත්මයෙක් නො වේ. එයින් බැහැර වූ කාලයට ගැලපෙන පර්යේෂණ සිදු කරන ගොවි මහත්මයෙකි. තව ද, ජගත් මහතාගේ සොයා ගැනීම සම්බන්ධයෙන් ජාතික ගොවි සංවිධානයේ සභාපති හා සබරගමුව විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්ය තිලක් කන්දේගම මහතාගේ නිරීක්ෂණයට ද ලක් වී ඇති අතර ඒ මහතා ද මේ සම්බන්ධයෙන් තමාට හැකි පමණින් උදව් කිරීමට සූදානම්ව සිටී. මේ අනුව, ජගත් ගොවි මහතාට මෙම සොයා ගැනීම ඉදිරියට ගෙන යාමට ආත්ම ශක්තිය හා ධෛර්ය ලබාදීම සැමගේ යුතුකම වන්නේ ය.

*(මෙම ලිපිය සකස් කිරීම සඳහා ජගත් ගොවි මහතා වෙත මා යොමු කළ කහතුඩුව ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර හා ජාතික ගොවි පෙරමුනේ කොළඹ දිස්ත්‍රික් සභාපතිනි පර්ලි රංජනි මහත්මියට හෘදයාංගම ස්තුතිය මෙයින් පුද කෙරේ).*

**සරත් විජයගුණවර්ධන**

*අංලෙවි සහකාර (මාධ්‍යවේදී)*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

19 වැනි පිටුවෙන්...

## ජනගහනය.......

අඩුවන බවකි. විවාහ වන වයස් පරතරය හා විවාහ සංස්ථාව තුළ දරුවන්ගේ සංඛ්‍යාව වැඩිවීම අපේක්ෂා කිරීම අපහසු ය. මේ තුළින් සිදුවන්නේ ජනගහනය වයස් ගතවීම නිසා ජනගහන පිරමීඩය වෙනස් වෙමින් ඉහළ ස්ථරයන් පුළුල් වීමයි.

ශ්‍රී ලංකාවේ ජනගහනයේ වයස අවුරුදු 65 සහ ඊට වැඩි පිරිස් වගු අංක 2 න් පැහැදිලි වේ.

**වගු අංක - 02 වයස්ගත ජනගහනය**

| සංගණන වර්ෂය | මුළු ජනගහනයෙන් අවු.65 සහ ඊට වැඩි පිරිස් | |
|---|---|---|
| | ප්‍රමාණය (දශ ලක්ෂ) | ප්‍රතිශතය |
| 1971 | 0.54 | 4.2 |
| 1981 | 0.64 | 4.3 |
| 2001 | 1.06 | 5.6 |

මේ ආකාරයෙන් ජනගහනය වයස් ගතවීම සහ ශ්‍රී ලංකා ආර්ථිකයට විවිධ වාසි සහ අවාසි සහගත තත්ත්වයන් උදා වේ.

එනම්, රාජ්‍ය අයවැයට, විශ්‍රාම වැටුප් සම්බන්ධව, යැපීම් අනුපාතය කෙරෙහි සහ ශ්‍රම බලකාය හා විරැකියාව සම්බන්ධව එවන් තත්ත්වයක් උදා විය හැකි ය. මේ සම්බන්ධව වෙනම මාතෘකාවක් යටතේ සාකච්ඡා කළ යුතු අතර සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් කරා පිය නගන වර්තමානය තුළ අනාගතයේ සිදු විය හැකි ජනගහනය වයස් ගතවීම නිසා සිදුවන හා සිදුවිය හැකි තත්ත්වයන් පිළිබඳව විමසිලිමත්වීම වැදගත් වේ.

## ප්‍රාර්ථනා...............

දුර......
ඇස ගැටෙන මානයේ
වැව කණ්ඩියේ
ඈත කොණක සිට
නුඹ
නගන සිනා හඬ
මගේ
දෙසවන සිප ගනියි...
නුඹේ......
සී පද රාවයත්
හරියටම
නුඹේ සිනහව වගේමයි
ලස්සනයි............
තාල සිත්තම් මවයි
වීරියෙන් මා තැනූ
ගේන මැද පැල් පතට
නුඹ නගන සිනා හඬ
වාසනාවක් මැ යි...........
මට සිතෙයි....
නුඹ නගන සිනා හඬ
හෙට දිනේ
මගෙ පැලෙන් ඇසෙන තුරු
මම බලා ඉන්නවා...........

**සී.යූ. සේනානායක**